www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*චීන-ජපාන ආතතීන් පිටුපසින්*

# වොෂිංටනය ජපන් මිලිටරිවාදී ගින්නට තෙල් දමයි

## Behind China-Japan tensions
## Washington fuels Japanese militarism

**දෙවන කොටස**
**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2005 අප්‍රේල් 26**

*පහත පල වන්නේ කොටස් දෙකකින් යුත් ලිපි මාලාවක අවසාන කොටසයි.*

ජපානයේ ආරක්ෂක පිලිවෙතෙහි සිදුව ඇති අර්ථභාරී වෙනස්කම් දෙකක් මෑත ලියවිලිවල ප්‍රකාශයට පත්ව තිබේ. පසුගිය දෙසැම්බරයේ දී ආන්ඩුව ජාතික ආරක්ෂක වැඩපිලිවෙලෙහි සැලසුම (එන්ඩීපීඕ) යන නමින් සවිස්තරාත්මක ආරක්ෂක ලියවිල්ලක් නිකුත් කලේ ය. එය ප්‍රථම වතාවට, ජපානයට විභවීය තර්ජනයක් ලෙස උතුරු කොරියාව සමග චීනය ද නම් කලේ ය. "චීනය . . . සිය න්‍යෂ්ටික හා මිසයිල බලයන්ගේ මෙන් ම නාවික හා ගුවන් බලයන්ගේ ද නවීකරනය ඉදිරියට තල්ලු කරන අතර ම, සිය සමුද්‍ර ක්‍රියාකාරකම්වල වපසරිය පුලුල් කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී. ජපානය මෙම ප්‍රවනතා වෙත සිය අවධානය යොමු කිරීම අවශ්‍ය ය." යැයි එය ප්‍රකාශ කලේ ය.

එන්ඩීපීඕ මගින් පිලිබිඹු කෙරෙන්නේ, එක්සත් ජනපදය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන, චීනයේ වත්මන් හා අනාගත ආරක්ෂක ධාරිතාවන් පිලිබඳව පමනට වඩා පුම්බන ලද චිත්‍රයක් මවා පාන මෙයාකාර ආරක්ෂක හා ඔත්තු සේවා සමාලෝචන ය. මතකයට නගා ගත යුතු කාරනාවක් නම්, ව්‍යවස්ථාවේ සාමවාදී වගන්තිය පිලිබඳව කටින් බතල කොල සිටුවන ගමන්, ජපානය පසුගිය දශක පහක කාලය මුලුල්ලේ, සිය "ස්වයං-ආරක්ෂක හමුදා" ලෝකයේ පවත්නා මැනවින්ම සන්නද්ධ හා විශාලතම මිලිටරි හමුදාවන්ගෙන් එකක් බවට ගොඩනගා ඇති බවයි. ජපානයේ නිල මිලිටරි වියදම් චීනයේ එම වියදම් මෙන් දෙගුනයකට වඩා ඉහල ය.

2005 පෙබරවාරි මැද දී, ජපාන හා එක්සත් ජනපද ආරක්ෂක හා විදේශ ඇමතිවරුන්ගේ ඉහල පෙලේ රැස්වීමක්, දෙවන තීරනාත්මක වෙනසක් සලකුනු කලේ ය. එහි දී නිකුත් කෙරුනු ඒකාබද්ධ නිවේදනය ප්‍රථම වතාවට තායිවානය අන්‍යොන්‍ය ආරක්ෂක උත්සුකතාවක් ලෙස විශේෂයෙන් ම නම් කලේ ය. එම සැඳහුම -- "තායිවාන සමුද්‍ර සන්ධිය සම්බන්ධ ගැටලුවලට සාමකාමී විසඳුමක්" පිලිබඳ අවශ්‍යතාව -- බෙහෙවින් පරිපාලිත ස්වරූපයක් දැරූ නමුත් එහි අර්ථය කිසිදු සැකයකින් තොර විය. එය නියෝජනය කලේ "එක චීනයක්" පිලිබඳ පිලිවෙතට සහයෝගය දීමේ ටෝකියෝවේ පෙර පැවති පරීක්ෂාකාරී ආස්ථානයේ සිට, තායිවානය චීනයේ කොටසක් ලෙස නාමිකව පිලිගන්නා නමුත් ඒ කෙසේ වෙතත් බෙයිජිනයට එරෙහිව එය ආරක්ෂා කිරීමට කැපවී ගන්නා, වොෂිංටනයේ සැක සහිත ආස්ථානය කරා මාරුවකි.

මෙම නිවේදනයේ අර්ථභාරය බෙයිජිං පාලනයේ අවධානයෙන් මිදුනේ නැත. එය ප්‍රතිචාර දැක්වූයේ චීනයේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීම පිලිබඳව ජපානය කෝපාවිෂ්ඨව හෙලාදැකීමෙනි. බෙයිජිං පාලනය යුක්තියුක්ත ලෙස උත්සුක වන්නේ. ලෝකයේ විශාලතම ආර්ථික බලයන් දෙක වන එක්සත් ජනපදය හා ජපානය අතර ගැඹුරු වන සහයෝගිතාව තමන් වටලෑමේ එක්සත් ජනපද මූලෝපායක අතිශයින් ම භයානක අංගයක් ය යන්න පිලිබඳව ය. මෙම භීතිය 2001 සැප්තැම්බරයේ පටන් තව දුරටත් උත්සන්න කෙරී ඇත්තේ, ඇෆ්ඝනිස්තානයේ හා මධ්‍යම ආසියාවේ එක්සත් ජනපද මිලිටරි කඳවුරු ඉදිකිරීම, එක්සත් ජනපදය ඉන්දියාව හා නේපාලය සමග වඩා සමීප ආරක්ෂක සබඳතා වර්ධනය කර ගැනීම මෙන් ම අග්නිදිග ආසියාවේ සිය මිලිටරි මැදිහත්වීම් යලි තහවුරු කර ගැනීමේ එක්සත් ජනපද ප්‍රයත්නයන් මගිනි.

තිරයට පිටුපසින්, ඇමරිකානු මිලිටරිය වඩා පුලුල් ලෙස භූගෝලීයව යලි ස්ථානගත කිරීමේ කොටසක් ලෙස එක්සත් ජනපද-ජපාන මිලිටරි සබඳතාවන්ගේ මූලික ප්‍රති-සංවිධානයක් දැන් මැනවින් ක්‍රියාවට නැගෙමින් පවතී. "එක්සත් ජනපදය හා ජපානය අතර වේගයෙන් පරිනත වන සන්ධානය පිටුපසින් අවශ්‍ය ගාමක බලය සම්පාදනය කිරීමේ විධික්‍රම නිර්නය කරනු" පිනිස එක්සත් ජනපද හා ජපාන මිලිටරි නිලධාරින් සහ ආරක්ෂක නිලධරයන් එලඹෙන මාස ගනනාව තුල වොෂිංටනයේ දී, ටෝකියෝවේ දී හා හවායි දූපතේ පිහිටි එක්සත් ජනපද පැසිෆික් අනදෙන මූලස්ථානයේ දී රැස්වීම් පවත්වනු ඇතැයි අප්‍රේල් 15 දා *වොෂිංටන් ටයිම්ස්* පත්‍රය සටහන් කලේ ය.

මෙලෙස වඩ වඩා සාකච්ඡා පැවැත්වීමේ අරමුන වන්නේ, 1960 දී එක්සත් ජනපද ජපාන ආරක්ෂක ගිවිසුම යලි ලිවීමෙන් පසුව "සන්ධානයේ වඩාත් ම අතිමූලික හා දුර දිග යන සංශෝධනය" සිදු කරනු ඇති ඒකාබද්ධ නිවේදනයක් මේ වසරේ පසු කලෙක නිකුත් කරනු පිනිස සූදානම් වීම ය. *වොෂිංටන් ටයිම්ස්* පත්‍රයට අනුව, නව සබඳතාව පුහුනු වීම්, ඔත්තු සේවා, යුද සැලසුම් හා

මෙහෙයුම් යන කටයුතුවල දී වඩා තීව්‍ර සහයෝගිතාවක් සහිතව "සමානයන්ට සමීප" අයගේ හවුලක් වනු ඇත.

ජපාන ආන්ඩුව ප්‍රතිපත්තියක් වසයෙන් සැලසුම්වල එක් ප්‍රධාන අංගයක් සඳහා අනුමැතිය දී ඇතැයි අප්‍රේල් 13 දා අසාහි ෂිම්බුන් පුවත් පත වාර්තා කලේ ය: එනම් එක්සත් ජනපද හමුදාවේ 1 වන බලකායේ අන දෙන මූලස්ථානය වොෂිංටන් ප්‍රාන්තයේ සිට ටෝකියෝවේ දකුනේ යොකොහමා අසල පිහිටි කැම්ප් සමා වෙත මාරු කිරීම යි. මෙම පියවරෙහි එල්ලය වන්නේ ලෝකයේ ඕනෑම තැනකට පහර දීමෙහි හැකියාව සහිත වඩා නම්‍යශීලී, ජංගමශීලී එක්සත් ජනපද මිලිටරියක් පිලිබඳ පෙන්ටගනයේ සැලසුම් සමග ගැලපෙන පරිදි, ජපානයේ හා දකුනු කොරියාවේ ඇමරිකානු හමුදා කප්පාදු කරන අතරෙහි පවා, එක්සත් ජනපද-ජපාන මිලිටරි සබඳතා ඉහල ම මට්ටමින් තව දුරටත් ශක්තිමත් කිරීම යි.

## ව්‍යවස්ථා සංශෝධන

එක්සත් ජනපදය හා ජපානය අතර වැඩෙන මිලිටරි සහයෝගිතාව ජපානයේ ව්‍යවස්ථා සංශෝධන සඳහා නව පීඩනයන් නිර්මානය කර තිබේ. ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමට සහයෝගය පිනිස එතෙර ක්‍රියාකාරි යුද කලාපයක ජපාන හමුදාවන් යෙදවීමට ඉඩ සලසනු වස් 9 වන වගන්තිය හඳුනාගත නොහැකි තරමට වෙනස් කර ඇත. කොයිසුමී යොදා ගෙන ඇත්තේ, 1990 ගනන්වල කාම්බෝජයේ හා නැගෙනහිර ටිමෝරයේ "සාම සාධකයන්" ලෙස ජපාන හමුදා යෙදවීම යුක්තියුක්ත කිරීමට යොදා ගනු ලැබූ කඩතුරාව මෙන්, ජපාන මිලිටරි හමුදා හුදු මානව හිතවාදී මෙහෙයුම්වල යොදවා ඇත යන කුටෝපාය යි.

ඒ කෙසේ වෙතත්, සන්ධානයක කොටසක් ලෙස හෝ නැතිනම් සෘජුව ම හෝ එතෙර යුද්ධයකට ජපානයේ මිලිටරි හමුදා යෙදවීමට නීතිමය බාධාවක් ලෙස 9 වන වගන්තිය තවමත් පවතී. යාබද ඊසාන දිග ආසියානු කලාපය තුල එක්සත් ජනපද හා ජපාන හමුදාවන්ගේ ඒකාබද්ධ සැලසුම් හා මෙහෙයුම් සම්බන්ධයෙන් පවා ව්‍යවස්ථාව ගැටලු මතු කරයි. ජපානයේ ක්ෂනික ආරක්ෂාව සම්බන්ධයෙන් පමනක් නොව කලාපයේ වඩා පුලුල් එක්සත් ජනපද මෙහෙයුම්වලට සහයෝගය පිනිස ද පෙන්ටගනය සමග සහයෝගීව කටයුතු කිරීමේ අවස්ථාව ජපාන මිලිටරියට ලබා දෙන පනත් කොයිසුමී ආන්ඩුව විසින් සම්මත කරනු ලැබ ඇත. ඒ කෙසේ වෙතත්, ජපානයේ මැදිහත්වීමක් -- නිදසුනක් ලෙස තායිවානයට මිලිටරි පිටුබලය සැපයීමේ එක්සත් ජනපද මෙහෙයුම්වලට -- "ආත්මාරක්ෂාව" ලෙස යුක්තියුක්ත කිරීමේ අපහසුතාව තවමත් පවතී.

බැලිස්ටික් මිසයිල් ආරක්ෂක පවුරක් සම්බන්ධයෙන් එක්සත් ජනපද-ජපාන සහයෝගිතාව පිලිබඳ කාරනාවට පැමිනෙන විට ගැටලුව විශේෂයෙන් ම උග්‍ර වෙයි. උතුරු කොරියානු මිසයිල් ප්‍රහාරයකින් ආරක්ෂා වීමේ හැකියාව ලබා ගැනීම ජපානයට අවශ්‍ය ය යන පදනම මත කොයිසුමී එක්සත් ජනපද ව්‍යාපෘතියට දෙන සහයෝගය යුක්තියුක්ත කර තිබේ. මිසයිල ආරක්ෂක පවුරේ මූලික අරමුන වන්නේ චීනයේ මිසයිල අවි ගබඩාව නිෂ්ක්‍රීය කිරීම ය යන කාරනාව වහංගු කිරීමට මෙම දේශපාලන උපාය සමත් වන්නේ යන්තමිනි. එහෙත් එය ජපානයේ ආරක්ෂාව හැර වෙනත් අරමුනක් වෙනුවෙන් මිසයිල ආරක්ෂක පද්ධතිය ඒකාබද්ධව යෙදවීම පිලිබඳ ගැටලුව වඩා සංකීර්න කරයි.

"එක්සත් ජනපද-ජපාන සන්ධානය පුනර්ජීවනය කිරීම" යන මැයෙන් ආනුභාව සම්පන්න දක්ෂිනාංශික එක්සත් ජනපද චින්තන පර්ශදයක් වන ඇමරිකන් එන්ටර්ප්‍රයිස් ඉන්ස්ටිටියුට් ආයතනය විසින් පෙබරවාරි/මාර්තු මාසවල පල කරන ලද ලිපියක් දෙරට අතර වඩා සමීප මිලිටරි සබඳතා උද්යෝගිමත්ව අනුමත කලේය. කෙසේ වෙතත් ලිපියේ කතුවරයා වන ඩැන් බ්ලමන්තාල්, "ආත්මාරක්ෂාවට සෘජුව ම සම්බන්ධ නොවන මෙහෙයුම්වලට සහාය පිනිස නාවික බල ඇනි යොදවන ලෙස එක්සත් ජනපදය ජපානයෙන් ඉල්ලා සිටින අවස්ථාවක දී පැන නැගිය හැකි ගැටලුවලට අවධානය යොමු කලේ ය. "මිසයිලයක මග අවුරාලීමේ තීන්දුවක් හා සම්බන්ධිත කෙටි කාල රාමු යටතේ, ප්‍රතිපත්ති සකසන්නන් විසින් දිග්ගැසුනු ආරක්ෂක සාකච්ඡා පැවැත්වීම කල නොහැකි දෙයක් වනු ඇත. මග අවුරාලීමට ලක් වන මිසයිලය ඉලක්ක කොට ඇත්තේ ජපානයට ද වෙනත් එක්සත් ජනපද සගයකුට ද නැත හොත් එක්සත් ජනපද දේශයට ද යන වග අවශ්‍යයෙන් ම නිර්නය කර ගැනීමකින් තොරව පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ස්ථානීය තීන්දු ගැනීමට මිලිටරි නිලධාරින්ට සිදු වනු ඇත." යනුවෙන් ඔහු පැහැදිලි කලේ ය.

ජපාන ව්‍යවස්ථාව පරිපූර්න සංශෝධනයකට ලක් කිරීමේ සැලසුම් දැනටමත් බොහෝ දුර ගොස් තිබේ. ඩයට් සභාවේ පහල මන්ත්‍රී මන්ඩලයේ කමිටුවක් වසර පහක සාකච්ඡා සාරාංශ ගත කරන සිය අවසන් වාර්තාව අප්‍රේල් 15 දා ඉදිරිපත් කලේ ය. වාර්තාව ව්‍යවස්ථාවේ විවිධ අංශ ගනනාවක් සම්බන්ධයෙන් අවධානය යොමු කොට ඇති නමුත් 9 වන වගන්තියට යෝජනා කර ඇති සංශෝධන වඩාත්ම මතභේදයට තුඩු දෙන කරුනු අතර විය. කමිටුව සියලු පාර්ලිමේන්තු පක්ෂවල නියෝජිතයන්ගෙන් සමන්විත වන බැවින් පැහැදිලි නිර්දේශ ඉදිරිපත් කොට නැත. කෙසේ වෙතත්, යෝජනාවල මූලික තේමාව වූයේ "ආත්මාරක්ෂාව" සහ "සාමුහික ආරක්ෂාව" සඳහා පැහැදිලිව ම ඉඩ දීම යි -- මෙහි දී "සාමුහික ආරක්ෂාව" වනාහි විශේෂයෙන් ම එක්සත් ජනපදය සමග වඩා ක්‍රියාකාරී ආරක්ෂක සන්ධානයක් සඳහා මාවත විවෘත කරනු ඇති වාක්‍යාංශයකි. ඉහල මන්ත්‍රී මන්ඩලයෙන් ද මෙයාකාර වාර්තාවක් සැකසෙමින් පවතී.

කොයිසුමී ව්‍යවස්ථා සංශෝධන සඳහා ක්‍රියාකාරීව තල්ලුව සපයමින් සිටී. එල්ඩීපී කමිටුවක් ව්‍යවස්ථා සංශෝධන පිලිබඳ කෙටුම්පතක් ඊලග මාසයේ දී තරම් ඉක්මනින් නිකුත් කිරීමට නියමිත ය. එහෙත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මන්ඩල දෙකෙහිම තුනෙන් දෙකක බහුතරයක් ද ජනමත විචාරනයකින් ඡන්දදායකයන් බහුතරයකගේ සහාය ද අවශ්‍ය වන මෙම ව්‍යවස්ථා සංශෝධනයේ දී ආන්ඩුව මූලික බාධක ගනනාවකට මුහුන දී සිටී. එල්ඩීපීය, එහි සහාග හවුල්කරු වන නව කොමේටෝ පක්ෂය සහ විපාර්ශ්වික ජපාන ප්‍රජාතන්ත්‍ර පක්ෂය වාර්තාවට සහයෝගය දී ඇතත් සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය සහ ජපාන කොමියුනිස්ට් පක්ෂය එයට විරුද්ධ වී තිබේ. "සාමුහික ආරක්ෂාව" පිලිබඳ

තීරනාත්මක ගැටලුව සම්බන්ධයෙන් කමිටුව පාර්ශ්ව තුනකට බෙදී ඇත. එනම්, එයට විරුද්ධ වන්නන්, සහයෝගය දෙන අය සහ වඩා සීමිත සංශෝධනයකට සහයෝගය දෙන අය වසයෙනි.

9 වන වගන්තිය සංශෝධනය කිරීම පිලිබඳ පාර්ලිමේන්තුවේ පවත්නා විරුද්ධත්වය හා ඒ පිලිබඳ නොඑකඟතා මගින් උත්සුකතා ගනනාවක් පිලිබිඹු කෙරෙයි. පශ්චාත් යුද කාලීන ආන්ඩුවලට, මෙම සාමවාදී වගන්තිය, ජපානය යලි සන්නද්ධ වීම අරබයා චීනය හා සෙසු රටවල් වෙතින් එල්ල වූ විවේචන වෙනතකට හැරවීමේ පහසු රාජ්‍යතාන්ත්‍රික උපක්‍රමයක් බවට ඔප්පු වී තිබේ. කෙසේ වෙතත්, වඩා අති මූලික කාරනාව නම්, 1930 ගනන්වල හා 1940 ගනන්වල ජපානයේ ම්ලේච්ඡ මිලිටරිවාදී තන්ත්‍රය, වැඩ කරන ජනතාව අතර අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි ගැඹුරට ම කාවැදුනු සතුරුභාවයක් නිර්මානය කර තිබීමයි. ජාතිකවාදී මනෝගතීන් ඇවිස්සීමේ කොයිසුමීගේ ප්‍රයත්නයන් තිබිය දී ම, මෙම මනෝගතීන් තවමත් පවතී. ඉරාකයට ජපාන හමුදා යැවීමටත් 9 වන වගන්තිය සංශෝධනය කිරීමටත් එරෙහි විරුද්ධත්වය තුල එම මනෝගතීන් පිලිබිඹු වේ. පසුගිය මැයි මස මයිනිචි ෂිම්බුන් පුවත්පත මගින් කල ජනමත විමසුමක් මගින් පෙන්නුම් කෙරුනේ ජපාන වැසියන්ගෙන් සියයට 78ක් ව්‍යවස්ථා සංශෝධනයන්ට කැමති අතර සියයට 70ක් 9 වන වගන්තිය සංශෝධනය කිරීමට විරුද්ධ බවයි.

## ජපාන මිලිටරිවාදයට එක්සත් ජනපදයේ පිටුබලය

9 වන වගන්තිය සංශෝධනය කිරීම සහ ජපානය යලි සන්නද්ධ කිරීම සඳහා වඩාත්ම ආක්‍රමනශීලී ලෙස සහයෝගය දෙන්නන් ටෝකියෝවෙන් වෙනුවට වොෂිංටනයෙන් සොයා ගත හැකි ය. පසුගිය අගෝස්තුවේ දුන් සම්මුඛ සාකච්ඡාවක දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොලින් පවෙල් අනතුරු ඇඟවූයේ ඔවුනට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය අවශ්‍ය නම් ටෝකියෝව වගන්තිය සංශෝධනය කිරීම ගැන සැලකිල්ල යොමු කල යුතු බවටයි. "ජපානය ලෝක කරලියේ පූර්න භූමිකාවක් ඉටු කිරීමට යන්නේ නම්, ආරක්ෂක මන්ඩලයේ පූර්න ක්‍රියාකාරිත්වයකින් සහභාගි වන සාමාජිකයෙක් බවට පත් වන්නේ නම්, එය ආරක්ෂක මන්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා ගන්නා ආකාරයේ වගකීම්වලට උර දෙන්නේ නම්, 9 වන වගන්තිය එම ආලෝකයෙන් පරීක්ෂා කර බැලීමට සිදු වනු ඇත." යැයි ඔහු පැවසී ය. ඔහුගේ මෙම අදහස් දක්වීම් පිලිබිඹු කලේ, හුදු ජපානය සමග පමනක් නොව, එහි දේශපාලන සංස්ථාපිතයේ වඩාත්ම දක්ෂිනාංශික, මිලිටරිවාදී කොටස් සමග බුෂ් පාලනාධිකාරයේ පෙලගැසීමයි.

පසුගිය මාසයේ සිය ආසියානු සංචාරය තුල දී, පවෙල්ගේ පසුප්‍රාප්තික කොන්ඩලීසා රයිස් උද්යෝගයෙන් මෙසේ ප්‍රකාශ කලා යː "ජපානය ලෝකයේ ජාතීන් අතර සිය ගෞරවනීය තත්වය ලබා ගෙන ඇත්තේ තමන්ගේ ම ප්‍රයත්නයන් මගිනි, තමන්ගේ ම ස්වභාවය මගිනි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය සම්බන්ධයෙන් ජපානයට එක්සත් ජනපදය පැහැදිලිව ම සහයෝගය දෙන්නේ ඒ නිසයි." ටෝකියෝවේ සොපියා විශ්වවිද්‍යාලයේ කතාවක් පවත්වමින්, රයිස්, ජපානය "සමස්ත නැගෙනහිර ආසියාවේ ම දේශපාලනික හා ආර්ථික ප්‍රගතිය" පිලිබඳ ආදර්ශයක් ලෙස ද "ත්‍රස්තවාදයට එරෙහි භූගෝලීය යුද්ධයේ" කොටස්කරුවකු ලෙස ද ප්‍රශංසාවට ලක් කලා ය. ජපානය හා සෙසු රටවල් සමග එක්සත් ජනපදයේ සන්ධානයන් "චීනයට එරෙහිව නොවන" බව ප්‍රකාශ කල අතර ම, එහෙත් ඇය තව දුරටත් මෙසේ ද පැවසුවා යː "චීනය සාධනීය මාවතක තල්ලු කිරීමට හා පෙලඹවීමට අපට අවශ්‍ය ය." දකුනු කොරියාවේ දී, ඇය, ජපානයේ යලි සන්නද්ධ වීමට හා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ සාමාජිකත්වය සඳහා එක්සත් ජනපදය දෙන සහයෝගය පිලිබඳව ප්‍රශ්න කරමින් වාර්තාකරුවන් කල අදහස් දක්වීම් නොතකා හැරියේ එක්සත් ජනපද-ජපාන සන්ධානය පිලිබඳ සිය ප්‍රශංසාව පුනරුච්චාරනය කිරීමෙනි.

සිය මැත ඇමරිකන් එන්ටර්ප්‍රයිස් ඉන්ස්ටිටියුට් ලිපිය තුල, ඩෑන් බිලමන්තාල්, වොෂිංටනයේ මූලෝපායේ ඉලක්කය පිලිබඳව එතරම් නිශ්ශබ්දව සිටියේ නැත. එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති සකසන්නන් ශක්තිමත් ඇමරිකානු සගයකු ලෙස ජපානයේ නැගීම සාදරයෙන් පිලිගත යුතු හා එයට සහයෝගය දිය යුතු යැයි ප්‍රකාශ කිරීමෙන් පසුව ඔහු මෙසේ සඳහන් කරයිː "සන්ධානයේ මට්ටම ඉහල දැමීම ටෝකියෝවේ මූලෝපායික අරමුනු ගනනාවකට සේවය කරන අතර ම, මහ බලයක් බවට පත්වීමේ චීනයේ අභිලාෂයන් වලකාලීමේ එක්සත් ජනපදයේ මහා මූලෝපායේ දී එක්සත් ජනපදය සමග එක්වීමට ජපානය තීන්දු කර ඇත යන කරුන සාවද්‍ය විය නො හැකි ය. අගමැති ජුනිචිරෝ කොයිසුමීගේ නායකත්වය යටතේ, ටෝකියෝව, ජාත්‍යන්තර ප්‍රජාව තුල ජපානයේ ආරෝහපරිනාහයට මනා ලෙස සමානුපාතික වන ආකාරයේ ආරක්ෂක ආස්ථානයක් ගනු පිනිස, එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුතු ත්‍රස්ත විරෝධී යුද්ධයේ ද සිය ආරක්ෂක හැකියාවන් ඉහල දමා ගැනීමේ ජපාන ප්‍රයත්නයන් දිරිගැන්වීමේ වොෂිංටනයේ පිලිවෙතෙහි ද න්‍යෂ්ටික අවි සම්බන්ධයෙන් උතුරු කොරියාව සමග මුහුනට මුහුනලා පවත්නා ගැටුමෙහි ද වාසිය ඩැහැ ගෙන තිබේ."

කොයිසුමීගේ විචක්ෂන භාවය පිලිබඳව බිලමන්තාල් කරන වර්නනාව ටෝකියෝව සමග එක්සත් ජනපදය ඇති කර ගන්නා පෙලගැසීමේ තවත් අංගලක්ෂනයක් දෙසට අවධානය යොමු කරයිː එනම්, ජපන් ජාතිකවාදය ඇවිලවීමේ ආන්ඩුවේ ප්‍රයත්නයන් වඩවඩා විවෘතව ආරක්ෂා කිරීමකි. බුෂ් එක්සත් ජනපදයේ අන්ත දක්ෂිනාංශික ක්‍රිස්තියානි මූලධර්මවාදීන් මත වාරු වන්නේ යම් සේ ද කොයිසුමී පාදක වන්නේ, ආසියාව තුල ජපානය ගෙන ගිය විජිතවාදී ආක්‍රමන බටහිර අධිරාජ්‍යවාදයෙන් එම ප්‍රදේශ "විමුක්ත කර ගැනීමේ යුද්ධයක්" ලෙස සලකන සහ නාසි-ගැති කොටස් මහා යුදෙව් සංහාරක ව්‍යාපාරය පිලිබඳ සත්‍යය ප්‍රතික්ෂේප කරන ආකාරයෙන් ම නැන්කිංහි සිදු කල මහා විනාශය වැනි ජන ඝාතන පිලිබඳ පුවත් බටහිර ප්‍රබන්ධ ලෙස කෙලින් ම ප්‍රකාශ කරන, මිලිටරිවාදී තට්ටු මත ය. එබැවින් බුෂ් පාලනාධිකාරයේ ආධාරකරුවන්ට, එය එක්සත් ජනපද අවශ්‍යතාවන්ට රුකුල්

දෙන තාක් දුරට, ජපන් මිලිටරිවාදයේ ක්ෂමාලාපකයන් සමග එක්වීමේ අපහසුතාවක් නැතිවීම පුදුමයක් නො වේ.

"ඉතිහාස කාඩ්පත" ගැසීම ලෙස ඔහු නම් කරන ක්‍රියාවෙහි ලා -- එනම්, කුප්‍රකට යසකුනි සොහොන් බිම් නැරඹීමට යාම සහ ජපානයේ යුද වාර්තාවට සුදු හුනු ගාන ඉතිහාස පෙල පොත් පල කිරීම ආරක්ෂා කිරීම -- කොයිසුමී දක්වන දක්ෂකමට බිලමන්තාල් උපහාර පුදයි." සිය චීන මූලෝපාය හැඩ ගැස්වීමෙහි ලා, මහජන සහයෝගය ගොඩනගා ගැනීමටත් චීන පීඩනය ජය ගැනීමටත් කොයිසුමීට සිදු විය. ජපානයේ චීන පිලිවෙතෙහි දුර්වල ම අංගය -- "ඉතිහාස කාඩ්පත" -- දේශපාලන වාසියක් බවට දක්ෂ ලෙස පත් කර ගැනීම මගින් කොයිසුමී මෙම ද්විත්ව එල්ලයන් සාක්ෂාත් කර ගෙන තිබේ."

බිලමන්තාල්ට අනුව, කොයිසුමීගේ මහා දක්ෂතාව වී ඇත්තේ, ජපානයේ ගැඹුරින්ම ධ්‍රැවාන්තගත වූ මහජන මතය හමුවේ, ජපානය යලි සන්නද්ධ කිරීමේ සිය වඩා අති මූලික අරමුනු සඳහා ආවරනයක් ලෙස යුද කාලීන ජපන් අධිරාජ්‍යවාදයේ සංකේතවලට අනුග්‍රහය දැක්වීම මගින් කලාපීය ආතතීන් ඇවිලවීම යි. "චීන නායකත්වය මෙම සංකේතාත්මක කාරනය දිගට ම අවධාරනය කරන බැවින්, ජපානයේ ආරක්ෂක තත්වය සැලකිය යුතු ආකාරයකින් ප්‍රතිසංස්කරනය කිරීමේ කොයිසුමීගේ වැඩපිලිවෙලට එල්ල වී ඇත්තේ, එසේ නැති නම් එල්ල විය හැකිව තිබුනාට වඩා බෙහෙවින් අඩු විවේචනයකි. ඇත්ත වසයෙන් ම, චීන ජනතාව තුල ජපානයට තඩිබෑමේ පිලිවෙත කැකෑරීමට ඉඩ දීම මගින් චීනය තම ශක්තිය අධිතක්සේරු කර තිබේ."

ඇමරිකන් හෙරිටේජ් ඉන්ස්ටිටියුට් ආයතනයේ බිලමන්තාල්ගේ සගයකු වන ජේම්ස් ලිලේ, වෝල් ස්ට්‍රීට් ජර්නල් අප්‍රේල් 13 කලාපයට ලියූ අටුවාවක් තුල, චීනයේ මෑත ම ජපන්-විරෝධී විරෝධතා පිලිබඳව ඉහත කරුනට සමාන අදහසක් ඉදිරිපත් කරයි. ජපානයේ භූමි ප්‍රදේශ හිමිකම් පෑම් සහ මතභේදාත්මක පෙල පොත් පිලිබඳ කලාපීය ප්‍රතික්‍රියා "ගැඹුරු ඓතිහාසික එදිරිවාදිකම් හා අවිශ්වාසයක් පිලිබිඹු කරන" බව සඳහන් කරන ලිලේ එහෙත් ඊලඟට මෙසේ පවසමින් කොයිසුමීගේ ක්‍රියාවන් විවෘතව ම ආරක්ෂා කරයි: "20 වන සියවසේ ජපානයේ ආක්‍රමන හා වාඩිලෑම් තුල දී එහි ම්ලේච්ඡ ක්‍රියාකලාපය හේතුවෙන් චීනය හා කොරියාව ජපානයට ක්ෂමාවිරහිත ලෙස තඩි බා තිබේ. මෙයින් සමහරක් අව්‍යාජ හැඟීම් නියෝජනය කරයි. එනමුදු ඒ සමග ම සිය භාන්ඩ හා සුපිරි තාක්ෂනය ගිල දමන ගමන් ජපානයට තමන් ආරක්ෂා වී ගැනීමට සිදු වන තත්වයකට ඇද දැමීමේ ප්‍රයත්නයක් ද එමගින් පිලිබිඹු වෙයි."

චීනය සහ දකුනු කොරියාව තමන්ගේ ම දේශපාලන අරමුනු වෙනුවෙන් ජාතිකවාදී මනෝගතීන් පැහැදිලිව ම ගසා කයි. දශක දෙකක් තිස්සේ නිදහස් වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ක්‍රියාවට දමා ඇති සහ වැඩෙන ධනපති පන්තිය තුලට ඒකාග්‍ර වෙමින් සිටින බෙයිජිං නිලධරය, සිය අතීත සමාජවාදී මවාපෑම් මුලුමනින් ම පාහේ අතහැර දමා තිබේ. චීන නායකයෝ, ජපානයේ සිටින ඔවුන්ගේ ප්‍රත්‍යනීකයන් සේ, දරිද්‍රතාව හා විරැකියාව අරබයා ගැඹුරු වන හා පුලුල්ව පැතුරුනු වෛරය අපසරනය කිරීමට මෙන් ම, කලාපය තුල හා ජාත්‍යන්තරව චීනයට වඩා විශාල ක්‍රියාකලාපයක් සඳහා ඉඩකඩ විවෘත කරගැනීමටත් ජාතිකවාදය හිතාමතා ම අවුලුවති.

එමෙන් ම, කෙසේ වෙතත්, ජපන් අධිරාජ්‍යවාදයේ අතීත අපරාධ සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන යුක්තිකරනයන්ගේ එල්ලය නව අපරාධ සඳහා සූදානම් වීමක් ය යන්න පිලිබඳව ආසියානු ජනතාවගේ පුලුල් ස්ථරයන් අතර තේරුම් ගත හැකි භීතියක් පවතී. 1930 ගනන්වල මෙන්, ජපානය සිය දැවැන්ත නිෂ්පාදන පදනම පෝෂනය කරනු වස් අමු ද්‍රව්‍ය, විශේෂයෙන් ම තෙල්, ආනයනය මත විශාල වසයෙන් රඳා පවතී. ආර්ථික කඩා වැටීමේ හා අර්බුදයේ දශක එකහමාරක කාල පරිච්ඡේදයකින් පසුව, ටෝකියෝ පාලක ප්‍රභූවේ කොටස් ලාභ වෙලඳ භාන්ඩ, ශ්‍රමය හා වෙලඳ පොලවල් වෙත ප්‍රවිෂ්ටය සහතික කර ගනු වස් වඩා ආක්‍රමනශීලී හා ප්‍රසාරනවාදී මූලෝපායකට සහයෝගය දෙති. චීනය, රුසියාව හා දකුනු කොරියාව සමග ජපානයට පවතින භූමි ප්‍රදේශ ගැටුම්වලට අදාල පෙදෙස් සියල්ල ම තෙල් හා ගෑස් නිධි පිලිබඳ විභවයකින් යුක්ත ඒ වටා පිහිටි සාගරවල පිහිටා තිබීම අහම්බයක් නො වේ. සිය අභිලාෂයන්ට පිටුබලය සපයා ගනු වස්, සිය මිලිටරි මස් පිඩු ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලබා ගැනීම ජපානයට අවශ්‍ය ය.

එක්සත් ජනපද පාලක ප්‍රභූවේ සියලු ම කොටස් ජපන් මිලිටරිවාදයේ යලි ඉස්මතු වීම සාදරයෙන් පිලිගන්නේ නැත. ආසියාව තුල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා ආරක්ෂා කරගනු වස් පැසිෆික් කලාපයේ විනාශකාරී යුද්ධයක නිරතවීමට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට බල කෙරුනු කාලයක් තිබුනු බව සමහරෙකුට තවමත් සිහි කල හැකි ය. බුෂ් පාලනාධිකාරයේ වත්මන් විදේශ පිලිවෙත අදූරදර්ශී හා වග විභාගයකින් තොර එකක් ලෙස ඔවුහු සලකති. වර්තමානයේ දී, ටෝකියෝව, "සාමාන්‍ය ජාතියක්" ලෙස සිය තත්වය තහවුරු කර ගැනීම හා යලි සන්නද්ධ වීම සඳහා විධික්‍රමයක් ලෙස වොෂිංටනයට යටත් ද්විතියික ක්‍රියාකලාපයක් ඉටු කිරීමට සූදානම් වනවා විය හැකි ය. එහෙත් පෙල ගැසීම් වෙනස් විය හැකි ය. ජපනායේ අවශ්‍යතා ගැටෙන්නේ චීනයේ අවශ්‍යතා සමග පමනක් නො වේ, මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ සම්පත්වලින් අනූන කලාපයන් මත්තේ එක්සත් ජනපද පාලනය තහවුරු කර ගැනීමේ වොෂිංටනයේ දිගු කාලීන සැලසුම් සමග ද ජපානයේ අවශ්‍යතා වඩා අති මූලික ලෙස ගැටෙයි. 1941 දෙසැම්බරයේ පැන නැගි පැසිෆික් යුද්ධයේ බීජයන් වූයේ මේවා ය. ඒවා තවත් ලේ වැකි ගැටුමක් අවුලුවාලීමේ ගිනි පුපුර විය හැකි ය.

ජපානය පිලිබඳ වත්මන් එක්සත් ජනපද පිලිවෙතට එරෙහිව තියුනු ප්‍රහාරයක් එල්ල කරමින් "සැබෑ "චීන තර්ජනය"" යන මැයෙන් මෑත දී ලියූ ලිපියක් තුල චාල්මර්ස් ජොන්සන් නම් විද්වතෙක් සිය නිරීක්ෂනයන් මෙසේ ඉදිරිපත් කලේ ය:

"මීට වසර 40කට පෙර, මා චීන හා ජපන් ජාත්‍යන්තර සබඳතා පිලිබඳ ක්ෂේත්‍රයේ නව මහාචාර්යවරයකු ලෙස වැඩ කරන කල, එඩ්වින් ඕ රෙයිස්චනර් වරක් මෙසේ අදහස් දක්වූ අයුරු මට මතක ය. "1945 අපගේ ජයග්‍රහනයෙන් අප ලද දැවැන්ත ලාභය වූයේ සඳහට ම නිරායුධ කෙරුනු ජපානයක් ය." ජපානයේ උපත ලද, හාර්වර්ඩ් විශ්වවිද්‍යාලයේ ජපාන ඉතිහාසඥයකු වූ රෙයිස්චනර් ජෝන් කෙනඩි හා ලින්ඩන් ජොන්සන් යන ජනාධිපතිවරුන්ගේ පාලන කාලයන් තුල ටෝකියෝවේ එක්සත් ජනපද තානාපති ලෙස සේවය කලේ ය. මෙසේ පැවසීම මවිතයට කාරනාවක් වුවත්, 1991 දී සීතල යුද්ධය අවසන් වීමෙන් පසුව සහ විශේෂයෙන් ම ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ පාලනාධිකාරය යටතේ, එක්සත් ජනපදය ජපානයේ යලි සන්නද්ධ වීම දිරි ගැන්වීමට හා එය වේගවත් කිරීමට පවා තමන්ට කල හැකි සෑම දෙයක් ම කරමින් සිටී.

"එවන් වර්ධනයක්, නැගෙනහිර ආසියාවේ සුපිරි බලවතුන් දෙදෙනා වන චීනය හා ජපානය අතර වෛරය අවුලුවමින්, චීන හා කොරියානු සිවිල් යුද්ධවලින් ඉතිරි කෙරුනු, එම ගැටලු සහිත ප්‍රදේශ දෙක වන තායිවානය හා උතුරු කොරියාව පිලිබඳ ප්‍රශ්න සාමකාමී ලෙස විසඳා ගැනීමේ හැකියාව කඩාකප්පල් කොට, එක්සත් ජනපදයට බොහෝ සෙයින් නිසැක වසයෙන් ම පාඩු සිදු කරනු ඇති අනාගත චීන-ජපන් යුද්ධයක් සඳහා පදනම සකසයි. වොෂිංටනයේ දෘෂ්ටිවාදීන් හා යුදකාමීන් තමන් මුදා හරිමින් සිටින්නේ කුමක් ද යන වග අවබෝධ කර ගන්නේ ද යන්න පැහැදිලි නැත. එනම්, ලෝකයේ වේගවත් ම කාර්මික ආර්ථිකය වන චීනය හා කඩා වැටෙමින් පවතින නමුදු නිෂ්පාදන ඵලදායිත්වයෙන් ලෝකයේ දෙවන තැන සිටින ආර්ථිකය වන ජපානය අතර ඇති විය හැකි ගැටුමකි. මෙය වනාහි එක්සත් ජනපදය විසින් ඇති කෙරෙනු ඇති හා එක්සත් ජනපදයට බොහෝ සෙයින් පාඩු විඳීමට සිදු විය හැකි ගැටුමකි."

ජපානය හා චීනය අතර මෑත ම ආතතීන් සම්බන්ධයෙන් වොෂිංටනයේ ප්‍රතික්‍රියාව, ඊසාන දිග ආසියාවේ පමනක් නොව ජාත්‍යන්තරව පසුගිය වසර පහක කාලය තුල එහි වාර්තාව සමග ගත් කල, පැහැදිලි වන්නේ, තමන් මුදා හරින්නේ කුමක් ද යන වග ඔවුන් අවබෝධ කර ගත්තත් නැතත්, බුෂ් පාලනාධිකාරයේ යුද සෝෂකයන්, එහි විභවීය ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගැන නොතකා, ජපානය සමග මිලිටරි සන්ධානයක් වර්ධනය කර ගැනීමේ අභිප්‍රායෙන් පෙලෙන බවයි.

**සමාප්තයි.**

© www.wsws.org